කිව්වා අපි ලේක්හවුස් එකට ගිහින් බලමු කියලා. මොකද ඒ කාලේ දිනමිණේ හිටිය ජයවිලාල් විලේගොඩ මෙයාගේ යාලුවෙක්. ඒ මාර්ගයෙන් ඇවිල්ලා දිනමිණ කර්තෘ හමුවුණා. ඒ වෙනකොට දිනමිණේ චිත්‍රකතාවක් පළවෙලා තිබුණේ නෑ. කොහොම උනත් මට කෑලි තුනගානේ කතාවක් අදින්න කියලා කිව්වා. 'සුලසා' ජාතකය කොටස් 68කින් ඇන්දා. 1963 ජනවාරි පළවෙනිදා ඉඳලා දිනමිණේ මේ කතාව පළවුණා. ඒක තමයි මුලින්ම දිනමිණේ පළවුණ චිත්‍ර කතාව.

**ලේක්හවුස් එක බොහෝ චිත්‍ර ශිල්පීන්ගේ වගේම මාධ්‍යවේදීන්ගේත් තිඹිරි ගෙය වෙලා තියනවා. අද අන්ත විදිහට දේශපාලනයට යටපත්වෙලා තියන ලේක්හවුස් එක ඒ කාලේ කොහොමද ?**

ඒ කාලෙත් මේ වගේම තමයි. මම දිනමිණේ ෆ්‍රී ලාන්ස් ඉන්න කාලේ 1965 පත්තර දැන්වීමක් පළවෙලා තිබුණා අලුත් පත්තරයක් පටන්ගන්න එකකට කර්තෘ මණ්ඩල සාමාජිකයෝ ඉල්ලලා. මම මේකට අයදුම්පත්‍රයක් දැම්මා. ඉන්ටවිව් ආවා. බලනකොට කොහෙද ඉන්ටවිව් තියෙන්නේ ලේක්හවුස් එකේමයි. ගිහින් බැලුවම මේක ලේක්හවුස් එක ඇතුළෙම රහසේ ගහන දේශපාලන පත්තරයක්. 'ජනහිත' කියලා. ඔක්කොම වැඩ ටික ලේක්හවුස් එකේ කරලා අන්තිමේ වීරකේසරී මුද්‍රණාලයෙන් තමයි මුද්‍රණය කෙරුණේ. ටික කාලයක් ඒකටත් කාටුන් ඇන්දා. හැබැයි අපිට නිදහසේ අඳින්න බෑ. ඒ අය කියන අදහස තමයි අපි අඳින්න ඕනේ. ඒ නිසා මේ කාටුන්වලදි මම සම්පූර්ණ නම යොදන්නේ නැතුව 'හරිශ්' කියලා විතරක් යෙදුවා. ඒත් කාලයක් යනකොට මේ වැඩේ මට අප්‍රිය වුණා.

ලේක්හවුස් එකේ අවුරුදු 17ක් ෆ්‍රී ලාන්ස් කලත් මාව ස්ථිර කළේ නෑ. ආර්ථික අමාරුකම් නිසාත් විවේකයක් නැතුව වැඩ කරලා කරලා අසනීපයක්වත් එයි කියලා හිතුන නිසාත් අනාගතේ ගැනත් හිතලා අන්තිමේ මම තීරණය කළා ස්ථිර කරන්න කියලා ඉල්ලන්න. කීප සැරයක් උත්සාහ කරාට පස්සේ ඔන්න මට ස්ථිර කිරීමේ ලිවුමක් ලැබුණා ග්‍රේඩ් ටූ චිත්‍ර ශිල්පියෙක් විදිහට. ඒ වෙනකොට ලේක්හවුස් පත්තරවල වැඩිම චිත්‍ර ප්‍රමාණයක් කළේ මමයි. අන්තිමට පත්තර හෙඩින්ස්වල අකුරු ටිකත් ඇඳලා මහ රෑ තමයි ගෙදර ගියේ. එහෙම තියෙද්දි ඇයි මාව ග්‍රේඩ් ටූ වලින් ගත්තේ කියලා මම ගිහින් කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ මෙත්තානන්දගෙන් ඇහුවම එයා කිව්වා ඔයා නිසා තමයි ටූ වලින් ගත්තේ, අලුතෙන් කෙනෙක් ගන්න කොට ගන්නේ ත්‍රී වලින් කියලා. ඉතිං ඒකත් ඉවසගන මම හිටියා. මෙන්න මාස දෙකක් යනකොට පිටින් ගෑණු ළමයෙක් ගත්තා කෙලින්ම ග්‍රේඩ් වන් වලින්. මට හරියට හිතට අමාරුයි. ඒ ගැන ඇහුවම මට කිව්වා ඒක ඔයාට ප්‍රශ්ණයක් නෙවෙයි. ඒක ඉහලින් ආව නියෝගයක් කියලා. මට ලේක්හවුස්එක එපාම වුණා. මේක වෙනස් නොකළොත් මාසයක් ඇතුළත අස්වෙනවා කියලා මම අස්වීමේ ලිපියක් දුන්නා. මම හිතුවා මම කරපු වැඩ කන්දරාව බලලා හිටිය කාලය බලලා අඩුතරමින් මට ග්‍රේඩ් වන් දෙයි කියලා. මොන. මට යන්ඩ කියලා ඒ අය නිකං හිටියා. එතනින් මගේ ලේක්හවුස් රස්සාව ඉවර වුණා.



**ලේක්හවුස් එකෙන් අයින් වෙලා ඔබ සිත්තර පත්තරේට සම්බන්ධ වෙනවා ?**

ඔව්. ලේක්හවුස් එකෙන් අයින් වුණාට පස්සේ කැමිලස් පෙරේරා මහත්තයා මට කතා කළා 'සිත්තර' පත්තරේ වැඩ කරන්න එන්න කියලා. මල්ටි ෆැක්ස් එකෙන් තමයි සිත්තර ගැහුවේ. චින්තන ජයසේන තමයි පත්තරේ කළේ. ඒ වුණාට වැඩිපුර වගකීම් පැවරිලා තිබුණේ කැමිලස් මහත්තයාට. එහෙදි මට කිව්වා සතියකට කතා දෙකක් අඳින්න. රුපියල් 3000/- දෙනවා. වැඩිපුර අඳින්න වුණොත් කෑල්ලකට රුපියල් 250/- ගානේ දෙන්නම් කියලා. ලේක්හවුස් එකේ මැරීගෙන වැඩ කරලත් මට මාසෙකට ලැබුණේ 1200/- යි. ඉතිං මේක හොඳ ගෙවීමක් වුණා. වැඩත් අඩුවුණා.

**ඔය අතරේ ඔබ මුද්දර නිර්මාණය, පොත් කවර නිර්මාණය, බිතු සිතුවම් ඇඳීම වගේ විවිධ චිත්‍ර වැඩවලත් යෙදෙනවා. මේ පසුබිමත් එක්ක ඔබ කුඩා කාලයේ ගෙවුව දුෂ්කර ජීවන රටාවෙන් ගොඩ එන්න පුලුවන්කම ලැබුණද ?**

ඇත්තටම ආර්ථිකයේ ඇඟට දැනෙන වෙනසක් ඇතිවුණේ ඔය එකම ආයතනයක රස්සාව කරද්දිවත් නෙවෙයි. යුනිසෙෆ් එකේ පෝස්ටර් වගයක් කරද්දියි. ඒක අහම්බෙන් මට ලැබුන වැඩක්. මුලින්ම ඒක බාර අරගෙන හිටිය මහත්තයෙක් මට කියලා චිත්‍ර කීපයක් අන්දගෙන ඒකට මට සාමාන්‍ය ගෙවීමකුත් කළා. පස්සේ වතාවක යුනිසෙෆ් එකෙන් කෙලින්ම මට කතා කරලා චිත්‍ර කීපයක් ඇඳලා දෙන්න කිව්වා. ඒවට මම ඉල්ලන ඕනේ මුදලක් ගෙවන්න ඒ අය කටයුතු කළා. ඒකෙන් තමයි ගෙවල් හදාගෙන වාහනයක් අරගෙන යම් මට්ටමකට ආවේ. පත්තරවල වැඩ කරද්දි හුගාක් මහන්සි වෙලත් ලැබුණේ එදිනෙදා ජීවත්වෙන්න ප්‍රමාණවත් මුදලක් විතරයි.

**ඔය අතරේ ඔබ පන්සල්වල චිත්‍ර ඇඳීම, තොරණ්වල චිත්‍ර ඇඳීම වගේ දේවලුත් කරනවා.**

පත්තරවල අධික වැඩ නිසා මම ඔය පැත්තේ වැඩ බාරගත්තේ බොහොම අඩුවෙන්. 56 දි මුලින්ම ගමේ තරුණ පිරිසක් කරපු වෙසක් තොරණකට තමයි මුලින්ම චිත්‍ර ඇන්දේ. ඊට පස්සේ අවුරුද්දෙත් ඒක ලැබුණා. පන්සල්වල චිත්‍ර අඳින්න ලැබුණෙ පස්සේ කාලෙක. මුලින්ම ඇන්දේ කොළඹ වරාය චෛත්‍යියෙ ඇතුළත චිත්‍ර. වෙනත් කෙනෙක් කරලා තිබුණ චිත්‍ර එකකට එකක් ගැළපෙන්නේ නෑ කියලා මාපලගම විපුලසාර හාමුදුරුවෝ තමයි මාව එක්ක ගිහින් ඒක කරන්න බාර දුන්නේ. අම්බලන්ගොඩ කලුවඩුමුල්ල විහාරයේ චිත්‍ර කරන්න ලැබුණා. ඒවා කළේ ලීවල. ඒකත් වෙනත් කෙනෙක් බාගෙට කරලා වැඩ නැවතිලා තිබුණ එකක්. අලුතෙන්ම වැඩක් විදිහට අත තිබ්බේ ශ්‍රීලංකාරාම විහාරයේ චිත්‍ර අඳින එකට. දැනටත් ඒකෙ වැඩ කරගෙන යනවා.

**වෙනත් ඇඳීම් එක්ක ගත්තම පන්සල්වල චිත්‍ර ඇඳීම මොන වගේ ද?**

මේකෙදි ඉතිං හිටගෙනම තමයි වැඩ කරන්න වෙන්නේ. මේකෙ වැදගත්ම කාරණය තමයි චිත්‍රවල දළ සටහන නිවැරදිව යොදාගන්න එක. හුගාක් වෙලාවට ඒක කරන්නේ කඩදාසිවල. ඊට පස්සේ ඒ කඩදාසි බිත්තියට තියලා රේඛා සටහනක් ඇඳ ගන්නවා. A4 කඩදාසියේ ඇඳලා ප්‍රොජෙක්ටර් එකකින් බිත්තියට වද්දන ක්‍රමයකුත් තියනවා. වරාය චෛත්‍යියේ චිත්‍ර කළේ ඒ විදිහට. මොකද මේ චිත්‍ර කෙලින්ම බිත්තියේ අඳින්න ගියාම වරදක් වුණාම වෙනස්කම් කරන්න අමාරුයි.

**අනිත් කලා අංගයන් වගේ නෙවෙයි අද චිත්‍ර කියන්නේ ජනතාවගෙන් ඈත් වෙච්ච කලා අංගයක් වගේ නේද පේනෙන්නේ ?**

අද අනිත් හැම දෙයක්ම වගේ චිත්‍ර නිර්මාණත් බටහිර ක්‍රමේට ගැතිවෙලා මොඩර්න්වෙලානේ. ඒ නිසා මිනිස්සුන්ට මේවා තේරෙන්නේ නෑ. ඉස්සර කාලේ චිත්‍ර ප්‍රදර්ශණයක් තියනකොට ඒක බලන්න විශාල පිරිසක් ආවා. අද එහෙම එන්නේ නෑ. හැබැයි අද වුණත් ඡායාරූප ප්‍රදර්ශණයක් තිබුණොත් ඒකට සෙනග එනවා. හේතුව මේකයි. එදා ඇඳපු චිත්‍ර වගේ නෙවෙයි මේ මොඩර්න් වුණ චිත්‍ර. සායම් ටින් එකක් ෆෑන් එකකට විසිකරාම ෆෑන් එක කැරකෙන වේගෙට අර සායම් කිසියම් රටාවකට විසිරිලා යනවා. අද ඒකත් චිත්‍රයක්. මෙහෙම මොඩර්න් වෙලා ගිහිල්ලා අන්තිමේ අද වෙනකොට මොකුත්ම නැති සුදුපාට තැවරුමත් චිත්‍රයක් වෙලා. මේ මෑතක දවසක් මම සෞන්දර්ය ආයතනයට ගිය වෙලාවක ඒකේ ආචාර්යවරයෙක් මාව එක්ක ගිහින් චිත්‍ර වගයක් පෙන්නුවා. හැම එකේම තියෙන්නේ කුණුහරුප. එකක තියනවා පුරුෂ ලිංගය විවිධ දිශාවලට ඇඹරි ඇඹරි ගිහින් මල් පිපිලා. ඒ ආචාර්යවරයාම කියනවා ඕක තමයි අද චිත්‍ර කලාවට වෙලා තියන විපත්තිය කියලා. ඉතිං මේවගේ බහුබූත මිනිස්සුන්ට තේරෙන්නේ නැති නිසා මිනිස්සු අද චිත්‍ර බලන්නේ නෑ. බැලුවත් වැඩිහරියක් තේරෙන්නෙත් නෑ.

**අපි පවුලේ තොරතුරු ටිකක් කතා කරමු.**

බැඳලා ඉන්නේ කුසුම්. එයත් දැන් දක්ෂ චිත්‍ර ශිල්පිනියක්. මට එන සමහර වැඩ මම එයාට පවරනවා. මහින්දාගමනය, විජය කුවේණි චිත්‍රපටිවල චිත්‍ර ඇන්දේ එයා. පොත් කවර අඳින එකත් කරනවා. එයාගේ චිත්‍ර ප්‍රදර්ශණයකුත් තියලා තියනවා. දුව සුමුදු කල්පනී. විවාහ වෙලා.



එයා චිත්‍ර පැත්තට ඒ තරම් යොමුවුණේ නෑ. පරිගණක පැත්තට තමයි යොමුවුණේ.

**කොහොමද විවාහය සිදුවුණේ ?**

මම බඳිනකොට වයස අවුරුදු හතලිහයි. මම ජීවත්වුණ තත්ත්වය නිසා මට කසාදයක් ගැන හිතන්න ඉඩක් ලැබුණෙම නෑ. එක පැත්තකින් ආර්ථික අමාරුකම්. අනෙක් පැත්තෙන් පවුලේ ප්‍රශ්ණ. රැයක් දවාලක් නැතුව චිත්‍ර ඇඳලත් මේවා විසඳගන්නත් බැරිව බොහොම අවිවේකී ජීවිතයක් තමයි ඒ කාලේ තිබුණේ. මට විවේකී නිශ්කලංක ජීවිතයක වටිනාකමත් විවාහක ජීවිතයක තියන කරදරකාරී බවත් හොඳටම තේරිලා තිබුණ නිසා කසාදයක් බඳින්න ඕනේ නෑ කියලා තමයි මම හිතං හිටියේ. කොහොම හරි අයියයි නංගියි දෙන්නත් කසාද බැන්දට පස්සේ වතාවක් අම්මට හොඳටම අසනීප වුණා. ඒ වෙලාවේ ලෙඩ ඇඳේ ඉඳගෙන මට කතාකරලා අම්මා ඇහුවා 'පුතේ මට නිදහසේ මැරෙන්න ඕනේ. දැන්වත් මට කියපං උඹ කසාදයක් බඳිනවද නැත්ද' කියලා. එදා අම්ම ඒ ප්‍රශ්ණේ අහපු හැටි මට වෙනදට වැඩිය වෙනසක් දැනුනා. මම අම්මට කිව්වා අම්මා බෙහෙත් ටික බීල සනීප වෙන්න. එතකොට මම මගේ තීරණය කියන්නම් කියලා. එදා රෑ එළිවෙනකම් මට නින්ද ගියේ නෑ. මම කල්පනා කළා. මම බඳිනවද? එහෙම නම් කාවද බඳින්නේ? ඇයි බඳින්නේ කියලා. ඒ වෙනකොට මට ආව යෝජනා ගොඩක් තිබුණා. සමහර ගෑණු ළමයින් ගැන මට පොඩි ප්‍රසාදයක් ඇතිවෙලත් තිබුණා. ඒත් ඒ වෙනකම් කාවහරි බඳින අදහසක් තිබුණෙම නෑ. ඉතිං කල්පනා කරලා කරලා අන්තිමට තීරණය කළා කුසුම්ව බඳින්න. කුසුම් මංගලිකා මගේ රසිකාවියක්. ඒ වෙනකොට එයා කීප සැරයක් අපේ ගෙදරත් ඇවිල්ලා තිබුණ නිසා අම්මා එයා ගැන දැනගෙන හිටියා. පහුවදාම මම අම්මට කිව්වා එහෙම නම් මම කුසුම් බඳින්නද කියලා. අම්මා කිව්වා කවුරු හරි කමක් නෑ. මට ඕනේ උඹ බඳිනවා දකින්නයි කියලා. පස්සේ කුසුම්ට මගේ අදහස කීව්වා. එයා කිසිම කතාවක් නැතුව අහගන ඉදලා යන්න ගියා. ඒ කාලේ එයා හිටියේ නුවර. සතියකට විතර පස්සේ මට එයා ලිවුමක් එවලා තිබුණා. මහත්තයා මම වගේ ලෙඩෙක් කසාද බැඳගෙන අමාරුවේ වැටෙන්න එපා. හොඳ කෙනෙක් හොයලා බැඳගන්න කියලා. මොකද මෙයා පොඩි කාලෙ පරීක්ෂා කරපු වෛද්‍යවරු කියලා තියනවා හෘදය වස්තුවේ හිලක් තියනවා. විවාහ වෙන්න එපා කියලා. මම ඒක දැනගෙනයි හිටියේ. ඔය කාරණය නිසා ගෙදරිනුත් එයාව කසාද බන්දන අදහස අතහැරලයි තිබුණේ. මම කල්පනා කළා හරි ප්‍රශ්ණයක් වෙන්නේ ළමයි හම්බවෙන්න ගියාමනේ. මමත් විවාහය ජීවිතයෙන් අයින් කරලා හිටපු මිනිහා. ඉතිං ළමයි ගැන මොකට හිතන්නද. බැන්දට ළමයි නොහද ඉන්න පුළුවන්නේ කියලා. එහෙම දෙන්නටම යහපතක් වෙන විදිහක් ගැන කල්පනා කරලයි මම එයාව බඳින්න තීරණය කළේ. දෙවෙනි වතාවටත් මම එයා හමුවුණ වෙලාවේ කරුණු පැහැදිලි කිරීමක් කළා ඇයි මම මේ විදිහට විවාහ යෝජනාවක් ගේන්නේ කියලා. පස්සේ එයා කැමති වුණා. මාස තුනක් ඇතුළත අපි කසාද බැන්දා. බලාපොරොත්තු නොවුණ විදිහට කිසිම කරදරයක් නැතුව ස්වාභාවික විදිහටම දරුවෙකුත් ලැබුණා.



**හෙට දවස ගැන යම් සැළසුමක් තියනවද ?**

මුල් කාලේ පත්තරවල කොටස් වශයෙන් ගිය චිත්‍රකතා කීපයක් පොත් විදිහට මුද්‍රණය කරන්න හිතාගෙන ඉන්නවා. ළමා කතා පොතක් ලියලා තියනවා ඒකත් ඉක්මනින් පළකරන්න හිතාගෙන ඉන්නවා. ඒ අතරේ පන්සල් ලැබුණොත් ඒව කරන්නත් කැමැතියි.

ශ්‍රීලාල් සෙනෙවිරත්න
Srilal333@gmail.com

**Experienced teacher for all levels of Maths,**

Science and VCE Chemistry and Biology.
Individual and group classes.
Times and
locations are flexible.
$15p/h.

call-0451417502